# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1770/15 - 2012 අගෝස්තු මස 08 වැනි බදාදා - 2012.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.1/2011.

### 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත

2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 වැනි වගන්තිය සමග කියවිය යුතු 30 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2012 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2012 අංක 01 දරන දුම්කොළ නිෂ්පාදන (ලේබල් කිරීමේ සහ ඇසුරුම් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙම නියෝග ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට මාස තුනක කාලයක් ඉකුත්වන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. දුම්කොළ නිෂ්පාදන භාවිතය හෝ දුම්කොළ නිෂ්පාදනයන් භාවිතය මගින් පිටවන දුමාරය හේතුවෙන් සෞඛ්‍යයට සිදුවන බලපෑම් හෝ උපද්‍රව සම්බන්ධයෙන් දුම්කොළ නිෂ්පාදන අඩංගු කිසිදු පැකට්ටුවක, පාර්සලයක, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක හෝ ලේබලයක අසත්‍ය, නොමඟ යවන සුළු හෝ රැවටිලි සහගත පණිවුඩ අඩංගු නොවිය යුතු ය.

3. බෙදා හරින ලද, විකුණන ලද හෝ විකිණීම සඳහා අර්පණය කරන ලද දුම්කොළ නිෂ්පාදන සහිත කිසිදු පැකට්ටුවක, පාර්සලයක, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක හෝ ලේබලයක බෙදාහරින ලද, විකුණන ලද හෝ විකිණීම සඳහා අර්පණය කරන ලද දුම්කොළ නිෂ්පාදනයක් වෙනත් බෙදාහරින ලද විකුණන ලද, හෝ විකිණීම සඳහා අර්පණය කරන ලද වෙනත් දුම්කොළ නිෂ්පාදනයකට වඩා අඩු හානියකින් යුක්ත යැයි ඍජු හෝ වක්‍රාකාරයෙන් හැඟෙන පරිදි ''අඩු'', ''සැරනැති'', ''අධික සැරනැති'', ''මෘදු'' හෝ ''අමතර'' යනා දී වචන අඩංගු පදයන්, විස්තරයක්, වෙළඳ ලකුණු, රූපයක් හෝ වෙනත් යම් සළකුණක් අඩංගු නොවිය යුතු ය.

4. මෙම නියෝගවල උපලේඛනයේ දක්වා ඇති රූපමය සෞඛ්‍ය අවවාදයක්, යම් බෙදා හරිනු ලබන, විකුණනු ලබන හෝ විකිණීම සඳහා අර්පණය කරන ලද සිගරට් අඩංගු සිගරට් පැකට්ටුවක, පාර්සලයක හෝ සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක අඩංගු වන්නේ නම් මිස කිසිදු සිගරට් නිෂ්පාදකයෙකු, ආනයනකරුවෙකු, සිල්ලර වෙළෙන්දෙකු, ගබඩාකරුවෙකු, නියෝජිතයෙකු හෝ විකුණුම්කරුවෙකු විසින් එවැනි සිගරට් අඩංගු සිගරට් පැකට්ටුවක්, පාර්සලයක් හෝ සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් නිෂ්පාදනය, බෙදා හැරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

5. මෙම නියෝගවල උපලේඛනයේ සඳහන් කර ඇති රූපමය සෞඛ්‍ය අවවාදයක් සිගරට් අඩංගු සෑම සිගරට් පැකට්ටුවක, පාර්සලයක හෝ සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක දෙපැත්තෙහිම මුද්‍රණය කළ යුතු අතර එය එම පැකට්ටුවේ, පාර්සලයේ හෝ සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියේ ඉඩ ප්‍රමාණයෙන් සියයට අසූවකට (80%) වඩා අඩු නොවන ලෙස දෙපැත්තෙහිම මුද්‍රණය විය යුතු ය.

1A - G 16412 — 835 (2012/08)

6. විකිණීම සඳහා භාවිතා කරනු ලබන යම් දුම්කොළ නිෂ්පාදනයක් සහිත සෑම පැකට්ටුවක්, පාර්සලයක්, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් හෝ ලේබලයක් තුළ එම දුම්කොළ නිෂ්පාදනයෙහි අඩංගු නිකොටින්, තාර, ෆෝමල්ඩිහයිඩ් හා අනෙකුත් විෂ ද්‍රව්‍යය ඇතුළුව එහි සංඝටක සහ විමෝචක පිළිබඳ අදාළ විස්තර එම දුම්කොළ නිෂ්පාදන අඩංගු පැකට්ටුව, පාර්සලය, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටිය හෝ ලේබලය තුළ අඩංගු විය යුතු ය.

7. සෑම දුම්කොළ නිෂ්පාදනයක් ම පැකට්ටුවක්, පාර්සලයක් හෝ සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් තුළ විකුණුව ද, එහි අදාළ නිෂ්පාදනයේ නිෂ්පාදිත දිනය, මාසය හා වර්ෂ සඳහන් විය යුතු ය.

8. යම් දුම්කොළ නිෂ්පාදනයක් අඩංගු පැකට්ටුවක, පාර්සලයක, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක හෝ ලේබලයක අඩංගු සියලුම සෞඛ්‍ය අවවාද හා අනෙකුත් විමෝචක පිළිබඳ තොරතුරු මුද්‍රණ අකුරු දහයට නොඅඩු ප්‍රමාණයෙන් භාෂා තුනෙන්ම මුද්‍රණය කළ යුතු ය.

9. යම් සිගරට් නිෂ්පාදනයක් අඩංගු පැකට්ටුවක, පාර්සලයක, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක හෝ ලේබලයක ඇති රූපමය සෞඛ්‍ය අවවාද වෙනත් සලකුණක් හෝ පින්තූරයක් මගින් සැඟවීම නොකළ යුතු අතර, එම සෞඛ්‍ය අවවාදය කළු පසු බිමෙහි සුදු අකුරින් හෝ සුදු පසුබිමෙහි කළු අකුරින් මුද්‍රණය කළ යුතු ය.

10. සිගරට් නිෂ්පාදන අඩංගු යම් පැකට්ටුවක්, පාර්සලයක් හෝ සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් මත මෙම නියෝගවල උපලේඛනයේ දක්වා ඇති එක් එක් රූපමය සෞඛ්‍ය අවවාද ප්‍රභේද අතුරින් එක් වර්ගයක් පමණක් මුද්‍රණය කිරීමට විවිධ වෙළඳ නාම යටතේ සිගරට් නිෂ්පාදනය සිදුකරනු ලබන සෑම සිගරට් නිෂ්පාදකයෙකු විසින් ම වගබලාගත යුතු අතර, එම රූපමය සෞඛ්‍ය අවවාදය සෑම මාස හයකට වරක්ම වෙනස් කළ යුතු ය.

**උපලේඛනය**

***සෞඛ්‍ය අවවාද***

1. දුම්බීම දරුවන් රෝගී කරයි.

I වැනි වර්ගය




II වැනි වර්ගය



2. දුම්බීම හෘද රෝග ඇති කරයි.

I වැනි වර්ගය




3. දුම්බීම පිළිකා ඇති කරයි.

I වැනි වර්ගය




II වැනි වර්ගය



III වැනි වර්ගය




IV වැනි වර්ගය




4. දුම්බීම ලිංගික අප්‍රාණිකත්වය ඇති කරයි.

I වැනි වර්ගය




08-659